**නවගත්තේගම ප්‍රාදේශීය සභාව - 2022**

**---------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.61,676ක වටිනාකමින් යුතු අයිතම 03ක් අවසන් තොගය තුළ අඩුවෙන්ද රු.32,600ක වටිනාකමින් යුතු එක් අයිතමයක් අවසන් තොගය තුළ වැඩියෙන්ද දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | රු.317,500ක ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොළී ආදායමක් ගිණුම්ගතකර නොතිබුණි. | ලැබිය යුතු පොළිය ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | 2022 වර්ෂය තුළ විකුණා හෝ නොමිලේ ලබාදුන් 50087ක කුට්ටිගල් ප්‍රමාණයට අදාළ පිරිවැය අගය වූ රු.1,252,175ක වටිනාකම ජර්නල් සටහන් 75 මඟින් සමුච්චිත අරමුදලට හර කර තිබුණි. | 2022 වර්ෂයේ කුට්ටිගල් තොගයේ අඩුවීම සමුච්චිත අරමුදල මඟින් ගලපා ඇති බව. | -එම- |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම. | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මුරෙ .756 හා 757 | වාහන පිළිබඳ සමීක්ෂණයක් පවත්වා එම වාර්තා විගණකාධිපති වෙත කර නොතිබුණි. | ඉදිරියේදී සමීක්ෂණ කටයුතු නිසි පරිදි සිදු කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි නීතිරීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| මු.රෙ.1647 (ආ) | ආයතනය සතු වාහන වල උපකරණ පිළිබඳ සම්පූර්ණ සමීක්ෂණයක් ප්‍රවාහන නිළධාරීන් සහ රියදුරන් අතර භාරකාරීත්වය වෙන්වන විට සමීක්ෂණය කර නොතිබුණි. | -එම- | -එම- |
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 හි 3.3 වගන්තිය | චක්‍රලේඛයේ දක්වා ඇති ඇමුණුමේ සඳහන් ආකෘතිය පරිදි සටහනක් සභාව සතු වාහන සම්බන්ධයෙන් පවත්වාගෙන ගොස් නොතිබුණි. | සභාව සතු වාහන සම්බන්ධයෙන් ඉදිරියේදී අදාල ලේඛන පවත්වාගෙන යාමට කටයුතු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,267,997ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,927,612ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් හා බදු | 1,284 | 1,255 | 1,129 | 164 | 1,269 | 1,266 | 648 | 617 |
| කුලී | 6,192 | 2,845 | 2,813 | 73 | 5,837 | 4,439 | 3,657 | 791 |
| බලපත්‍ර ගාස්තු | 194 | 159 | 159 | - | 195 | 142 | 142 | - |
| වෙනත් ආදායම් | 876 | 686 | 666 | 31 | 4,758 | 4,765 | 2,625 | 3,484 |
| එකතුව | 8,546 | 4,945 | 4,767 | 268 | 12,059 | 10,612 | 7,072 | 4,892 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වරිපනම්**<br>වරිපනම් අයකල යුතු පෞද්ගලික දේපළ 116ක් හා රාජ්‍ය අංශයේ දේපළ එකකට අදාලව හිඟ වරිපනම් බදු ශේෂය පිළිවෙලින් රු.157,311ක් හා රු.6,411ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | දේපළ තහනම් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට කටයුතු සැළසුම් කර ඇත. වරිපනම් බදු නොගෙවන රාජ්‍ය ආයතන වෙත ලිපි යොමු කර දැනුවත් කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කඩ කාමර බදුදීමේ බදු ගිවිසුම අනුව මාසික බදු කුලිය එම මස 10 දින හෝ එදිනට පෙර ගෙවනු නොලැබුවහොත් සියයට 10ක අධි ගාස්තුවක් ගෙවිය යුතු බව සඳහන්ව තිබුණි. ප්‍රමාද වූ කාලය අනුව අධි ගාස්තු ප්‍රතිශතය වෙනස් නොවන නිසා බදුකරුවන්ට හිතාමතාම ප්‍රමාද කර බදු කුලී ගෙවිය හැකිව තිබූ බව නිරීක්ෂණය විය. | කඩ කාමර බදු ගිවිසුම අනුව මාසික බදු කුලිය පැහැර හරින්නන් සම්බන්ධයෙන් 10% ක අධි ගාස්තුවක් අය කිරිමට අමතරව ගිවිසුමේ 7වන හා 8 වන කොන්දේසිය ප්‍රකාරව කටයුතු කරන බව. | ප්‍රමාද වන කාලය මත පදනම්ව අධි ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල,පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වටිනාකම්හි එකතුව රු.95,000ක් වූ වත්කම් 2ක් වර්ෂ ගණනාවක සිට භාවිතා නොකර නිශ්ක්‍රීයව පැවතුණි. | යතුරු පැදියේ හිමිකරු තහවුරු කරගත් පසු හා ජල බවුසරයේ ලියාපදිංචිය අවලංගු කළ පසු අබලි ද්‍රව්‍ය ලෙස විකිණීමට කටයුතු කරන බව. | යතුරු පැදිය පවරා ගැනීමට කටයුතු කළ යුතු අතර ජල බවුසරය සුදුසු පරිදි අපහරණය කල යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ලී බඩු උපකරණ හා සවි කිරීම් ලේඛනයෙහි රු.2,027,120ක වටිනාකමැති වත්කම් වර්ග 38ක් ලේඛන ගත කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ලේඛන ගත නොවූ වත්කම් කඩිනමින් ලේඛන ගත කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සභාව සතු දේපල 27ක නිත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | ඉඩම් පවරා ගැනීමේ කටයුතු ඉටු කරමින් සිටින බව. | දේපල පවරා ගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන කැබ් රථයක් 1992 වර්ෂයේ දී ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් ලබා දී තිබුණ ද විගණිත දිනය වූ 2022 මාර්තු 11 වන දින වන විටත් එහි අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | -එම- |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ප්‍රාථමික හා ද්විතියික තනතුරු 04කට අදාළව පුරප්පාඩු 04ක් පැවතුණි. | ප්‍රාථමික බඳවා ගැනීම් තාවකාලිකව නතර කර ඇති බවට පළාත් පාලන කොමසාරිස්තුමා විසින් ලිඛිතව දැනුම් දී ඇති බව. | අවශ්‍ය සේවක ප්‍රමාණය නිවැරදිව හඳුනා ගෙන අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය හා මු.රෙ.133(1) අනුව අභ්‍යන්තර විගණනය, ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම හා එහි කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා සහාය වන ක්‍රියාවලියක් වූ නමුත් සභාවේ අභ්‍යන්තර විගණනය විසින් අවධානය යොමු කර තිබුණේ පැමිණීම, නිවාඩු, ආදායම් රැස් කිරීම, මාසික ධාවන සටහන් හා බැංකු ගිණුම් පරීක්ෂාව පිළිබඳව පමණි. | සියළු අංශ ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව. | සියලු අංශ ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනය සිදු කළ යුතුය. |

## 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තාත්වික හා නිවැරදි ලෙස ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 29ක් සඳහා සලසාගෙන තිබුණු රු.1,952,756ක් වූ ප්‍රතිපාදිත මුදලින් සියයට 50 සිට සියයට 99 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි. | ආර්ථික හා මූල්‍ය පසුබෑමත් සහ සභා අරමුදල් ප්‍රමාණවත් නොවීම නිසා අත්‍යාවශ්‍ය වියදම් පමණක් සිදු කරන ලද බව. | සලසා ගත් ප්‍රතිපාදන උපයෝගී කර ගෙන අයවැය ගත කාර්යයන් නිම කිරීමට කටයුතු කළ යුතුය. |

## 4.3 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරිසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම සඳහා හඳුනාගත් ක්‍රියාකාරකම් 01ක් සම්පූර්ණයෙන් ඉටුකර නොතිබූ අතර ක්‍රියාකාරකම් 06ක ප්‍රගතිය කරා ළගා නොවීම සියයට 07 සිට සියයට 60 දක්වා පරාසයක පැවතුණි. | ආර්ථික අර්බුධය හේතුවෙන් සුභ සාධක වැඩසටහන් අත්හිටුවන ලෙස දන්වා තිබූ බැවින් වැඩසටහන් සිදු නොකරන ලද බව. | අරමුණු හා ඉලක්ක නිසි පරිදි හඳුනා ගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය |